# ලංකාවේ මන්ත්‍රීවරුන්ගේ අශ්ලීල හැසිරීම් බිඳක්

**බිත්තර ආප්පයක් හරියට දැම්මේ නැත කියා එක් මන්ත්‍රීවරයෙක් ශ්‍රාවස්තියේ කෝකියාගේ කනට ගසා කන් අඩිය පැලුවේ ය.**

රටක නීති සම්පාදනය කරන්නේ ව්‍යවස්ථාදායකය වේ. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය ලෙස කටයුතු කරන්නේ පාර්ලිමේන්තුවයි. එනිසා ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ව්‍යවස්ථා සම්පාදකයින් ( legislators) ලෙස ද හඳුන්වනු ලබති.

නීති සම්පාදකයින්ද නීති රීති පිළිපැදිය යුතු ය. ඒවාට ගරු කළ යුතු ය. නීති රීති ආශ්‍රිතව ගොඩ නැගෙන සම්ප්‍රදාය, චාරිත්‍ර, නෛතික විධි විධාන අනුගමනය කළ යුතුය. ආදර්ශමත් ලෙස සියළු කල්හි සියළු තැන්හි ක්‍රියා කළ යුතුය. මේ තත්වය ශ්‍රීලංකාව තුළ පවතින්නේදැයි විමසා බැලීම කාලෝචිතය.

**1975** දී මහියංගන ප්‍රදේශයේ ගුරුවරියකගේ ස්ථාන මාරුවීමේ ලිපිය ප්‍රමාදවීම නිසා එඩ්වින් වික්‍රමරත්න නම් මන්ත්‍රීවරයා අධ්‍යාපන අමාත්‍යාංශයට ගොස් විෂය භාර ලිපිකරුට පහරදුන්නේය.

**1988** දී ජිනදාස වීරසිංහ මන්ත්‍රීවරයා තම වාහනය පසු කරමින් ගිය මහවැලි ව්‍යාපාරයේ රියැදුරෙකු පසුපස හඹාගොස් පිස්තෝලය එල්ලකොට මරණීය තර්ජණය කළේ ය.

**1991** දී මන්ත්‍රී නේවාසිකාගාරය වූ ශ්‍රාවස්තියේදී බිත්තර ආප්පයක් හරියට දැම්මේ නැතැයි කියා කෝකියාට කන් අඩි පැලෙන්නට පහරදීමට තරම් ත්‍රිකුණාමළයේ කේ. ඩී. කේ. එස්. ගුණවර්ධන නම් මන්ත්‍රීවරයා ආවේගශීලී විය.

**1998** දී බොරැල්ල පොලීසියේ ස්ථානාධිපතිගේ පුටුවේ බලහත්කාරයෙන් වාඩි වූ ඇස්. තොන්ඩමන් ඇමතිවරයා පොලීසියේ රාළහාමිලාට නියෝග දුන්නේය. **2007** දෙසැම්බර් මස රූපවාහිනී සංස්ථාවට ගිය මර්වින් සිල්වා ඇමතිවරයා එහි ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයාට පහරදුන්නේය ඔහු ළඟදී සමෘධි නියාමකයෙකු ගහකට තබා බැන්දේය. මේ ආදී වශයෙන් එදා මෙදා වූ විවිධ තොරතුරු සටහන් කළ හැකිය.

**1995** අයවැය විවාදයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය අයවැය ගැන කතා නොකොට ඉතා බැරෑරුම් ලෙස කථානායකවරයාටත් මන්ත්‍රීවරුන්ටත් කියා සිටියේ යහපත් ලෙස හැසිරෙන ලෙසට ය. එසේ නොවුණහොත් පාර්ලිමේන්තුව ගැන විශ්වාසය පලුදු වී මහජනතාව පාර්ලිමේන්තුවට ගල්ගසන්නට පටන්ගනු ඇතැයි එතුමිය බිය ප්‍රකාශ කළා ය.

මන්ත්‍රීවරු යැපෙන්නේ මහජන මුදලිනි. ඔවුන් මහජනයාගේ හිත සුව පිණිස ක්‍රියා කළ යුතුය. නිලධාරීන් වෙතින් වරදක් සිදු වන්නේ නම් ඒ සඳහා ක්‍රියා කිරීමට වත් පිළිවෙත් රාශියක් තිබේ. එම පිළිවෙත් අනුගමනය කරනු විනා ශාරීරිකව හා මානසිකව වද හිංසා පැමිණවීම් සහ ඔවුන් ගස්වල ගැට ගැසීම් මන්ත්‍රීවරුන්ට සුදුසු නොවේ.

පාර්ලිමේන්තුවේ වාද විවාද අඩංගු හැන්සාර්ඩ් වාර්තා කියවන, පරිශීලනය කරන විද්වතෙකු, ගුරුවරයෙකු හෝ ශිෂ්‍යයෙකු හෝ අද සොයාගත නොහැකි ය. එසේ නම් අපේ පාර්ලි මේන්තුවෙන් අර්ථාන්විත කාර්‍යයක් සිද්ධවන්නේ ද?

**2010** ජුනි මස මහා බ්‍රිතාන්‍යයේ ඊලිං ප්‍රදේශයේ (Ealing West) ලේබර් පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වන ස්ටීවන් ටිම් **(Stephen Timm)** ට ඡන්දදායක කාන්තාවක් විසින් පිහියෙන් ඇන බරපතළ තුවාල සිදු කළා ය. එතැන එවෙලේ සිටි මන්ත්‍රී ආරක්ෂකයින් හෝ පක්ෂ හිතවතුන් කිසිවෙකු පෙරලා ඒ කාන්තාවට පහර දුන්නේ නැත. ඔවුන් කළේ එම හිතුවක්කාර කාන්තාව නිරුපද්‍රිතව පොලීසියට බාරදීම හා ඇයට එරෙහිව නීති මගින් කටයුතු කිරීම ය. කිසිවෙකුත් හයිකාරකම් පෑවේ නැත.



පසුගිය මාසයේ ඇමති මර්වින් සිල්වා කැළණියේ සමෘධි නිලධාරියෙකු කඹයකින් අඹ ගහකට තබා බැන්දේය



Stephen Tim



John Profumo



Christeen Keeler

**1963** දී එවක බ්‍රිතාන්‍ය රජයේ ආරක්ෂක ඇමතිව සිටි ජෝන් ප්‍රොපියුමෝ **( John Profumo)** රාජ්‍ය රහසක් හෙළි කළායයි චෝදනා ලැබී ය. ක්‍රිස්ටීන් කීලර් නමැති සුරූපිය ආශ්‍රය කළ නිසා රහස් හෙළි වූ බවට විපක්ෂයෙන් කියා සිටියේය. පාර්ලිමේන්තුවට පිළිතුරු දෙමින් පොපියුමෝ ප්‍රකාශ කළේ තමා කිසිවිටෙක කීලර් තරුණිය ආශ්‍රය නොකළ බවයි. එහෙත් විපක්ෂය එම ආශ්‍රය පිළිබඳ කරුණු ඡායාරූප සහිතව ඔප්පු කළ විට පොපියුමෝ වරද පිළිගත්තේ ය. තමා බොරුවක් කියා පාර්ලිමේන්තුව නොමග යැවූ බව ද පිළිගත්තේ ය.

පසුව ඔහුට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ගෙන ආවේ රාජ්‍ය රහස් හෙළිකිරීම නිසා නොව පාර්ලිමේන්තුවට බොරුකියා එය නොමඟ යැවීම නිසා ය. පාර්ලිමේන්තුව නොමඟ යැවීම රාජ්‍ය රහස් හෙළිකිරීමටත් වඩා දරුණු ය.

**1995** වර්ෂයේදී ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාදයක් පැවැත්විණ. මෙහිදී එවකට පසුපෙළ මන්ත්‍රීවරුයෙකුව සිටි ඩලස් අලහප්පෙරුමගේ කතාවේ කාලය අවසාන බව නියෝජ්‍ය කතානායක අනිල් මුණසිංහ දැන්වීය. ඩලස් ඉතා කාරුණිකව ඉල්ලා සිටියේ ඒබ්‍රහම් ලින්කන් තම පුතාගේ ගුරුවරයාට යැවූ බව කියන ලිපියක් කියවීමට විනාඩියක් ලබා දෙන ලෙසය. මේ සඳහා තත්පර **30** ක් වත් ලබා දිය නොහැකි බවට විපක්ෂයේ මන්ත්‍රීවරු ඝෝෂා කරන්නට වූහ. ඔවුන්ට එරෙහිව ආණ්ඩු පක්ෂයේ අය ද කෑකෝ ගසන්නට වූහ. මේ කලබැගෑනිය නවත්වාගැන්මට නියෝජ්‍ය කතානායකවරයාට ද තරමක් ඝෝෂාකරන්ට සිදුවීය. අවසානයේ විනාඩියක කාලය බේරාගැනීමට ගොස් එදා විනාඩි **21** ක් ම පාර්ලිමේන්තුවේ කාලය නාස්තිවුණේ අනවශ්‍ය ලෙස කළහකාරී හැසිරීම් නිසා ය.

අද ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු බොහෝ දෙනා උගත්තු වෙති. අවාසනාවකට මෙන් පාර්ලිමේන්තු පදවිය ලබනවාත් සමග අමුතු හයියක් ආවේගයක් ඔවුන් වෙත ආරූඪ වෙයි. මේ ස්වභාවය ලංකාවේ පමණක් දැයි සිතේ. නීති සම්පාදකයින් නීතිගරුක වේ නම් සමාජය ද නිසැකවම නීතිගරුක වනු ඇත.

***ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී***

♦ ***මේජර් වී. බී. කරුණාරත්න***
**Major V. B . Karunaratne**
*Ex Deputy Sergeant-At-Arms in Sri Lanka Parliament*
**Oxford UK**



## උරුමයක් ජන්මයක් නොතකන වරිගයක්

කිසියම් රටක ශිෂ්ටත්වය, සභ්‍යත්වය, කොතරම් කලක් තිස්සේ ඒ රටේ පවතිනවද කියල දැනගන්න තියන සාධක තමයි ඒ රටේ ඇති පුරාවස්තු. තවමත් පවතින පරණ ගොඩනැගිලි, විහාරාරාම, ස්ථූප, ගල් කණු වගේ දේවල්. ලෝකෙ ඕනම දෙයක් කොපමණ ආරක්ෂා කරලා තිබුණත් විනාසවෙලා යන බව හැබැ වුනත් රටක වැසියන්ගෙ යුතුකම තමයි ඒ පුරාණ දේවල් ආරක්ෂා කරලා තැබීම සහ ඉදිරි පරම් පරාවලටත් ඒ දේවල් ඉතුරු කිරීම.

මුළු ලෝකයේම වෙසෙන ජාතීන්ගේ අද හස හා වැයම එය වුනත් අපේ රටේ ලංකාවේ සිරිත එය නොවන බවත්, අපේ අයගේ මානසිකත්වය ඊට හාත්පසින්ම වෙනස් දෙයක් බවත් මට හොඳට පේනවා. තියන පෞරාණික වස්තු ටික ආරක්ෂාකිරීම කෙසේ වෙතත් හොරකම් කරලා කාට හරි විකුණලා කීයක් හරි ගන්න ඇත්නම් කියන කල්පනාවෙන් ලංකාවෙ හුඟදෙනෙක් ඉන්න බවත් නිදන් වස්තු හාරන හොරු ගැන පළවන ප්‍රවෘත්ති වලින් පේනවා.



***මේ මෛත්‍රී බුදුන් ද ? නැත්නම් තාරා දෙවිඳුවද?***

මේ උඩ පින්තූරෙ දඹ රන් පිළිමයක්. මේක අයිති ලංකාවට. මේක අයත් වන්නෙ පොළොන්නරු යුගේට කියලා මම අහලා තියෙනවා. මේක දැනට තියෙන්නෙ ලන්ඩනයේ බ්‍රිතාන්‍ය කටුගෙයි. **(British Museum)** හුඟ දෙනෙක් කියන්නෙ මේ **මෛත්‍රී බුදුන්ගෙ** පිළිමයක් කියලා. තව මතයක් තමයි ඒ **තාරා** කියන දෙවිඳුවගෙ රූපය කියලා. කමක් නෑ. ඒක නෙවෙයි කාරණේ මේකයි.

මම දැක්කා ලංකාවෙ පත්තර කීපකම පළ වෙලා තිබුණා හාමුදුරුවරු පිරිසක්, සංස්කෘතික ආයතන කීපයක් සහ දේශපාල නඥයින් කීපදෙනෙක් එකතුවෙලා රජයෙන් ඉල්ලලා තිබුණු අධිරාජ්‍යවාදී යුගයේදී බ්‍රිතාන්‍යය ඇතුළු රටවල් ලංකාවෙන් පැහැර ගෙන ගිය සියළුම කෞතුක වස්තු එකක් නෑර ලංකාවට ආපහු ගෙන්න ගන්න කියලා. ඒ රටවල්වලට බල කරන්නලු.

හරි! කොයි විදියකින් හරි, අපේ ඒ කාලෙ ඉඳලා පිට රටට අරං ගිය පුරා වස්තු සේරම ලංකාවට ලැබුණයි කියමුකො. හොඳට තියේවි නේද? මම හරියටම කියන්නම් ඒවා ලංකාවට ගෙනාවොත් සුමානයක්වත් තියෙන්නෙ නෑ. ඒවා එක එක උගස්බඩු කඩේ තියේවි. නිදන් හොරුන් වැඩ වැඩිවේවි. ආයිත් ඒ දේවල් පිට රටට යාවි. මෛත්‍රී බුදුන්ගෙ රූපෙ තවම තියෙන්නෙ මෙහේ සුද්දො ළඟ තිබුණ නිසා. ලංකාවෙ තිබුණ නම් ඕක හොරකම් කරලා මකවලා මාල කරාබු අරුංගල් හදලා හුඟක් කල්. දැන් දවස ගාණෙ නිදන් හාරන එකේ වටින දේවල් පරිස්සම්වෙලා අගේටම තියේවි නේද? ලංකාවෙ කාටද පුරාණ දේවල් ආරක්ෂා කරන්න කැක්කුමක් තියෙන්නෙ?

කෝ අපේ ගුවන් විදුලි සංස්ථාවෙ තිබුණු පරණ ගී තැටි එකක්වත් දැන් තියනවද? කෝ අපේ සිනමාවේ පටන් ගත්තු කාලෙ ඉඳලා කෘති? සිනමාවෙ අවුරුදු 65 ක අතීතය පෙන්නන් කියලා දෙයක් සුරක්ෂිතව අරන් තියලා තියෙනවද? පරණ චිත්‍රපට ටික සේරම 83 ජුලි මාසෙ විජය ස්ටූඩියෝවට ගිනි තියලා විනාස කරලා දැම්මා. මේ පරණ ඒවා හොයන්නෙ පරිස්සම් කරන්නද? බම්බුව තමයි පරිස්සම් කරන්නෙ!

වැඩිය හිතන්න ඕන නැහැ. 1815 ඉඳලා ලංකාවෙන් අරං ගිහින් බ්‍රිතාන්‍ය කටුගෙයි තිබිලා 1960 විතර ලංකාවට ආපහු ලැබිච්ච සිංහළ සිංහාසනේට මොකද වුණේ? ඒක ලංකාවට ගෙනැල්ලා ටික කලක් අපේ කටුගෙයි තිබුණා. ඒ පාර කතාවක් ආවා, ඒකෙ ලී පරණ වෙලා, ගුල්ලො ගහලා, කඩාගෙන වැටුණයි කියලා. ඒකෙ ඔබ්බලා තිබුණු මැණික් එහෙම ගැලවිලා වැටෙන්න ඇතිය කියලා කටුගෙයි කට්ටිය කිව්වා. අන්තිමට දැන් සිංහාසනයක් අපි ළඟ නෑ. ඔන්න පරෙස්සම් කරපු හැටි.

අවුරුදු කීපයකට ඉස්සර, හොඳ කලාකාරයෙක් සහ නාට්‍ය ශිල්පියෙක්, ඒ වගේම දේශ දේශාන්තරවල ඇවිදලා ඇති, අභාව ප්‍රාප්ත ගාමිණී විජේසූරිය හිතවතා මට කිව්වා, "අන්න ලංකාවෙ පුස්කොළ පොත් සේරම ජර්මණියෙ මියුනික් කෞතුකාගාරෙ තියනවා. අපිට බයවෙන්න දෙයක් නෑ. තව කල්පයක් වුනත් ඒ මිනිස්සු ඒවා ලෝකෙටම බලන්න ආරක්ෂාකරලා තියාවි. ඒවා ලංකාවෙ තිබුණ නම් අද එහෙනම් ඒ එකක්වත් නෑ." කියලා.

ඒ නිසා ඔය පිටරට තියන දේවල් එහෙමම තියෙන්න දීපල්ල!

♦ ***වෙලේගෙදර රාළ*** **London**

## භික්ෂුවක්, ගිහියන් දෙදෙනෙක් පුරාවස්තු සොරකමට හිරගෙට

පසුගිය ජුනි 28 වෙනි දින, ගාල්ලේ එලියට් පාරේ, අටපට්ටම් විහාරයේ තිබූ පෞරාණික වටිනාකමින් යුත් ලෝකඩ බුද්ධ ප්‍රතිමාවක් සොරකම් කළ වරදට භික්ෂුවක් ඇතුළු පුද්ගලයින් තිදෙනෙකුට රුපියල් ලක්ෂ 4 බැගින් දඩයක් ගසා, අවුරුදු 10 ක් බරපතළ වැඩ ඇතිව සිරගෙට නියමකරමින් ගාල්ලේ ප්‍රධාන මහේස්ත්‍රාත් තමරා තෙන්නකෝන් මහත්මිය විසින් තීන්දුව දෙන ලදී.

ගෝනලගොඩ ආරච්චිගේ ජනක කුමාර, කන්කානම්ගේ චමින්ද සහ පරෙයිගම සුමන ස්ථවිර මෙම නඩුවේ චූදිතයෝ වූහ. මෙම නඩුව උසාවියට ඉදිරිපත් කරන ලද්දේ සොරකම අල්ලාගත් ගාල්ලේ පොලීසියේ අපරාධ විමර්ශණ ඒකකය විසිනි.

## නිදන් හාරා පුරාවස්තු පැහැරගත් තිදෙනා රිමාන්ඩ්

වැලිඔය නිකවැව ප්‍රදේශයේ ඉපැරණි චෛත්‍යයක් හාරා එහි වූ පුරාවස්තු පැහැරගත් බව කියන සැකකරුවන් තිදෙනෙකු පදවිය පොලීසිය මගින් ගිය 1 දා කැබිතිගොල්ලෑව උසාවියට ඉදිරිපත් කරන ලදුව මහේස්ත්‍රාත්වරයා ඔවුන් 13 දා තෙක් රිමාන්ඩ් කරන ලෙස නියම කරන ලදී. නිදන් හැරීමේ හොරකමට සම්බන්ධ සැහැවී සිටින තවත් සැකකරුවන් හතර දෙනෙකුද අත්අඩංගුවට ගැන්මට නියමිතය. පැහැරගෙන ගිය පුරා වස්තු අතර වටිනා මැණික් දෙකක්, පාෂාණ වලින් සකස්කරන ලද බහිරව රූප දෙකක්, කිරිගරුඬයෙන් නිම කළ ගල්වංගෙඩියක් සහ මිලිග්‍රෑම් 310 ක් බර රත්‍රං කැබැල්ලක්ද ඇතුළු ඒ පෞරාණික වස්තූන් නිකවැව ප්‍රදේශයේ නිවසක සඟවා තිබියදී අත් අඩංගුවට ගත් බව පොලීසිය උසාවියට හෙළි කළේය.

දැනට සති තුනකට පෙර එක් විහාරස්ථානයක් කොල්ලකෑමට ගිය පිරිසක නායකයා පොලිස් අධිකාරීවරයෙකි. ඔහුට ඒ නිධාන ගැන ඔත්තුව සපයා ඇත්තේ ඒ විහාරස්ථානයේ හිමි නමකි. ඒ පොලිස් නිලධාරියාද, භික්ෂුවද ඇතුළු හොර පිරිස දැන් අත්අඩංගුවේ පසුවේ. තවම නඩුව ඇසේ.